# 2019 පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය අනුස්මරණය

## 2025 අප්‍රියෙල් 21 දා

## අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිම්පාණන්ගේ විශේෂ පණිවුඩය

අති පූජ්‍ය ඕමල්පේ සෝභිත නාහිමිපාණෙනි, ශ්‍රී ලංකාවේ වතිකාන තනාපති අති උතුම් බ්‍රයන් උඩයිග්වේ හිම්පාණනි, අති උතුම් දුෂාන්ත රුද්‍රිගු හිම්පාණනි, අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු, හිටපු බදුල්ල රදගුරු හිම්පාණනි, කොළඹ සහයක රදගුරු අති උතුම් ඇන්ටන් රංජිත් හිම්පාණෙනි, ගරු. ශිව සුරේෂ් කුරුක්කල් තුමෙනි, ගරු ෂෙයික් මසූක් සජීර් මවුලවි තුමෙනි, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත අන්ද්‍රේ ෆ්‍රාන්ච් මැතිඳුනි, විදේශීය වින්දිතයන් අයත් වූ රටවල තනාපති තුමෙනි, තනාපති තුමියෙනි, සම්භාවනීය අමුත්තනි, ගරු පූජාප්‍රසාදිවරුනි, පැවිදි සොහොයුරු සොහොයුරියනි, පාස්කු ප්‍රහාරයේ වින්දිත පවුල් නියෝජනය කරන නෝනාවරුනි, මහත්වරුනි, සහෝදර සහෝදරියනි,

### සිදුවීම

මීට වසර 6කට පෙර කොළඹ කොච්චිකඩේ මේ සිද්ධස්ථානයේදීත්, මීගමුව කටුවාපිටිය ශා. සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැදුරේදීත්, මඩකලපුව සියෝන් දෙව්මැදුරේදීත් කොළඹ ප්‍රසිද්ධ සංචාරක නිකේතන 3කදීත් සිදුවූ මෑත ඉතිහාසයේ ශ්‍රී ලංකා දේශය මහත්සේ සසල කළ ත්‍රස්ත ප්‍රහාරයන් නිසා අප සහෝදර ශ්‍රී ලාංකිකයින් 225කට අධික පිරිසකුත්,

සංචාරක නිකේතනවල නැවතී සිටි විදේශකයින් හතලිස් පහකට අධික පිරිසකුත්, මරණයට පත්වීම හා 500යකට අධික පිරිසක් තුවාල ලැබීම හා විවිධ ආබාධයන්ට ගොදුරුවීම තුල, අප කවුරුත් අත්දුටු ඛේද ජනක මොහොත, මෙසේ නැවත වරක් අප සිහියට හා මෙනෙහි කිරීමට යොමුවී ඇත.

ඒ වේදනාකාරී සහ සහසික ක්‍රියාව නිසා විපතට පත්, විනාශවූ, තම ආදරවන්තයින් අහිමිවී අදටත් මහත්සේ තනිකම, පාළුව තුල පීඩා විඳින අප සොහොයුරු සොහොයුරියන්ට මෙහිදී, පලමුව, අපගේ හදපිරි  සංවේගය නැවත වරක් පලකර සිටිමු.

තම  ආදර වන්තයින් අහිමිවී, ජීවිත යථාර්තය පාළු බවට හා බලාපොරොත්තු විරහිත බවට පත්වූ ඒ සියලු දෙන අත්විඳින දුක හා වේදනාව තුනී කරන්නට අපට නොහැකිබව ඇත්තෙන්ම පිලිගන්නා අතර, අපට හැකි අයුරින් ඔවුන් සැනසීමට අප ගන්නා මේ උත්සාහය මගින් ඔවුන්ගේ ඒ වේදනාව තනිකම යම් පමණකින් හෝ විඳ දරාගන්නට ඔවුන්ට හැකි වේවායි අපි බලාපොරොත්තු වෙමු.

එදා මේ ප්‍රහාර මාලාව සිදුවූ පසු තම හැඟීම්වලට ඉඩදී යම් යම් අයගෙන් පලිගැනීමට උත්සාහ නොකරන ලෙස මා ඔබ සියල්ලන්ගෙන් ඉල්ලා සිටියේ, කෙසේ හෝ මේ විනාශකාරී ක්‍රියාදමය පිටුපස සිටිනවුන් සොයා ඔවුන් නීතිය හමුවට ගෙන එන බවටද පොරොන්දු වෙමිනි.

එසේ කළේ මෙවැනි මහා විනාශයක් එකම වේලාවක ස්ථාන කිහිපයකදීම සිදුවීමට සැලසුම් කිරීම සඳහා එම ක්‍රියාදාමයට මතු පිටින් ක්‍රියාකාරීවූ ත්‍රස්තවාදීන් සත් දෙනාටත් වඩා බලගතු වෙනත් කණ්ඩායමක සහය අවශ්‍ය වන්නේයයි තේරුම්ගත් නිසාය.

එලෙසම වෙනත් බලගතු පිරිසකගේ සහය නොමැතිව මෙවන් මහත් විනාශයක් සිදුකිරීම මේ අන්තවාදීන්· සත් දෙනාට පහසු දෙයක් නොවන්නේයැයි තේරුම්ගත් නිසාය. එදා පටන් අද වනතුරුත් අප අදාළ අංශවලින් ඉල්ලා සිටියේ සිදු වූ දෙය හරි හැටි විග්‍රහ කර බලා මේ පිටුපස ඇති සියලුම සැඟවුණු සාධක සොයා ගැනීමට කටයුතු කරන ලෙසයි.

**ජනාධිපති කොමිසම**

හිටපු ජනාධිපති සිරිසේන මහතා පත්කළ ජනාධිපති කොමිෂන් සභාව, සිය වාර්තාව තුල, මේ ප්‍රහාරය පිළිබඳ කරන ලද විග්‍රහයේදී කරුණු දෙකක් වෙත සිය විශේෂ අවධානය  යොමු කළේය. පලමු කරුණ, මේ සිදුවීමට කෙලින්ම හවුල් වූ සහරාන් හෂීම් සහ ඉස්ලාමීය අන්තවාදය අතර ඇති බැඳීම හා එහි පසුබිම සොයා, ඊට පිලියම් යෙදීය හැකි යෝජනා මාලාවක් වෙත යොමුවීම හා දෙවැනි කරුණ, මේ ප්‍රහාරය ගැන ඉන්දීය රහස් ඔත්තු සේවය විසින්, සිඩීන්ට පෙර, කිහිපවිටක් දැනුවත් කරනු ලැබුවද, එය වැළැක්වීමට කිසිදු පියවරක් නොගත් දේශපාලන නායකයින්, පොලිසියේ, හමුදාවේ නිලධාරීන් හා ඒවායේ  බුද්ධි අංශ මෙහෙය වන්නන්ගේ, වගකීම අතපසු කිරීම් හා ඒවාට දඬුවම් ලෙස නීති මාර්ගයෙන් කටයුතු කිරීමට නිර්දේශ කිරීම යන දෑය.

එහෙත් මේ ත්‍රස්ත ක්‍රියාව පිටුපස සිට මෙහෙය වූ හා ඊට අනුග්‍රහය ලබාදුන් වෙනත් බලවේග ගැන සොයා බලා, ඒ ගැන ක්‍රියාකාරී විය යුතු ආකාරය ගැන නිර්දේශ ඉදිරිපත් කිරීමට එම පරීක්ෂණ කොමිසමට නොහැකි විය. තම වාර්තාවේ ඉතා කෙටියෙන් සඳහන් කර ඇති ඇතැම් අභිරහස්‍යමය වෙනත් කරුණු පිලිබඳව, වැඩිදුර විභාග කිරීමට කොමිෂන් සභාවට කාලවේලාව හා ඒ සඳහා පැවැති රජයේ සහය නොලැබෙන බව වටහා ගෙන ඒවා ගැන විමර්ශනය කිරීමට ඔවුන්ගේ අවධානය යොමු නොවූනේයයි අපි සිතමු.

## වෙනත් කරුණු

මෙලෙස ඔවුන්ගේ අවධානය නොලැබුණු කරුණු අතර, කටුවපිටිය බෝම්බකරු හෂ්තුන්ගේ බිරිඳ වන සාරා ජෙස්මින්ට සිදුවූ දෙය, සොනික් - සොනික් යන අනවර්ථ නාමයෙන් පෙනී සිටි සාක්ෂිකරු, කවුරුන්දැයි හඳුනාගෙන ඔහුගෙන් ප්‍රශ්න කිරීම, ඔහු මාතලේ පොඩි සහරාන් යන අය හා එක්වී පාස්කු ප්‍රහාරය අයි එස් අයි එස් සංවිධානයට බැර කිරීමට ක්‍රියාකාරී වූයේ ඇයිද යන්න සොයා බැලීම, දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගැලනිගම හුවමාරුවේදී සැක සහිත ලොරියක් පරීක්ෂා කිරීමට යද්දී එය වැලැක්වීමට පොලිසියේ උසස් නිලධාරියෙකු ගත් උත්සාහය පිළිබඳ සිද්ධිය, වවුනතිවූහිදී, පොලිස් සැරයන්වරු දෙදෙනෙකුගේ ඝාතනය පිළිබඳව සත්‍යය වසන් කිරීමට පොලිසියේ උසස් නිලධාරියෙකු ක්‍රියා කළ අයුරු, සත්වන බෝම්බකරු ජමීල් හා බුද්ධි අංශ අතර තිබූ ගනුදෙනු පිළිබඳ සත්‍ය සොයා යෑම, වැනි දෑ අප සිහියට නැගේ.

කෙසේ වෙතත් එම කොමිෂන් සභාවට ඒ සඳහා අවශ්‍ය නෛතික බලය හා ශක්තිය ලැබ නොදී තිබීම මෙන්ම සිය වාර්තාව ඉදිරිපත් කිරීමට දෙන ලද කාලය මදි වීම යන කරුණු ගැන සලකා බලන විට ඔවුන් මේ පිළිබඳව තමන්ට හැකි අයුරින් ඒ සීමා මායිම් තුළ යුක්තිය ඉටු කිරීමට කටයුතු කළ බව පැහැදිලිය.

## මොටවූ විමර්ශණ

එහෙත් පසුව මතුවූ සැකය උපදවන බොහෝ සාක්ෂි ඉදිරියේ එදා එම කොමිෂන් සභා වාර්තාව බාරදෙනු ලැබූ රජය ගත් ඇතැම් ක්‍රියාමාර්ග හා අවංක හා සාධාරණ විමර්ශනයක් කිරීම මොට කර දැමීමට ගත් ප්‍රයත්නද, එම විමර්ශන අවංකව ඉටුකර දෙමුයි, 2019 වසරේ පැවැති ජනාධිපතිවරණයේදී පොරොන්දුවී, බලයට පැමිණි පසු, ඒවා කඩාකපල් කර දැමීමට ගත් ඇතැම් ක්‍රියා මාර්ග නිසා, මේ ප්‍රහාර පිටුපසින් අදිසි හස්තයක් ඇත්තේය යන සැකය කා තුළත් මතුවන්නට විය.

මෙම ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ජනගත කරන්නට ක්‍රියා නොකිරීම තුළ එම වාර්තාවේ නිර්දේශ යට ගැසීමට පාස්කු ප්‍රහාරයෙන් පසු බලයට පැමිණි ඇතැම් රජයන් කටයුතු කිරීම, අප තුළ සැකය දනවන තවත් කරුණක් බවට පත්විය. මේ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ වෙළුම් 6 කින් සමන්විත වාර්තාවෙන් නිල වශයෙන් අපට ඒ රජය විසින් බොහෝ දුරට කේවල් කිරීමෙන් පසු ලබා දෙන ලද්දේ එහි පළමුවන වෙළුම වන නිර්දේශ ඇතුළත් වෙළුම පමණි.

අනෙකුත් වෙළුම් පාර්ලිමේන්තුවේ පුස්තකාලයට පමණක් ලබා දීම හා ඒවා ප්‍රසිද්ධියට පත් නොකරන කොන්දේසියක් මත ඉන්පසු පැමිණි රජය ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවට පමණක් එම වෙළුම් ලබාදීමෙන් මේ වාර්තාව බොහෝ දෙනෙකුගේ විමර්ශනයට හා අධ්‍යනයට පාත්‍ර නොකරන්නට ඔවුහු වගබලාගත්හ.

මේ වෙළුම්ද ප්‍රසිඬ භාවිතය සඳහා නොවනබවට සීමා බන්දනයන්ට යට කර එළි දක්වන ලද ඒවා වීමෙන්, එම කොමිෂන් සභා වාර්තාව රටේ පොදු ජනතාවගෙන් වසන්කර තබාගැනීමට බලයට පැමිණි සියල්ලෝ ක්‍රියා කළ බව පැහැදිලි ය.

පසුගිය රජය සමයේදී, එම රජය මෙහෙයවූ අය, අප කතෝලික රදගුරු මණ්ඩලය තුල බෙදීමක් ඇතිකර ලාමක අයුරින් ප්‍රශ්නයෙන් පැන යන්නට උත්සාහ කළ අයුරු ඉතාමත් කණගාටුදායක වගේම බොළඳ ක්‍රියාමාර්ගයක් ලෙස හඳුන්වන්නට පුළුවන. මේ මවා පෑම ජාත්‍යන්තර මාධ්‍ය හරහාද ක්‍රියාවට නැංවීම ඇත්තෙන්ම ලැජ්ජා සහගත හැසිරීමක් බව කිව යුතුය. මාත් ඇතුලත්ව රදගුරු මණ්ඩලය මේ ගැන දරන්නේ එකම මතයක් වන බව මෙහිදී පැහැදිලි කළ යුතුය.

## <u>පාර රාජ්‍යය</u>

ඒ මතය වන්නේ, මේ ප්‍රහාරයන් ගැන ඉක්මන් හා කඩිසර විමර්ශනයක් සිදු නොවන තත්ත්වයක් එදා සිට පැවත එන නිසා වඩාත් ශක්තිමත් ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා පොලිසිය යොදවා මේ කටයුතු මීටත් වඩා උනන්දුවකින් කළ යුතු බවට වන මතය යි.

මෙහිදී කණගාටුවෙන් වුව ප්‍රකාශ කළ යුත්තේ, මේ ප්‍රහාරය පිලිබඳ සත්‍යය යට ගසන්නට පසුගිය දේශපාලන නායකත්වය ගත් උත්සාහය, අදටත් ක්‍රියාත්මක කරවමින්, එම පරාජිත දේශපාලනික බලවේගවලට යට වූ විවිධ රජයේ ආයතන මෙහෙයවන පාර රාජ්‍යයක් ක්‍රියාත්මක වන බවයි.

පාස්කු ප්‍රහාරයට පසු එවකට නීතිපති තුමා ලෙස කටයුතු කළ දප්පුල ද ලිවේරා මහතා **"මහා කුමන්ත්‍රණයක්"** මේ ප්‍රහාරය පිටුපස ඇතැයි කළ ප්‍රකාශය වුව, තුට්ටුවකටවත් නොසලකා හැර, එම තනතුරට පසුව පැමිණි නීතිපතිතුමා මෙන්ම නීතිපති දෙපාර්තමේන්තුවද මේ ප්‍රහාරයේ පසුබිම හා එහි නීතිමය කටයුතු ගැන දැක්වූ මන්දගාමී හා පවතින පාලකයන්ට ලෙන්ගතුව ක්‍රියා කිරීමේ පිළිවෙතද මේ ගැන අද වනතුරුම මෙම නිලධාරිවාදය දක්වන **"ශීතල වතුර ඉසීමේ"** ප්‍රතිපත්තියද නිසා ජනතාව විසින් පත් කරගන්නා ලද රජයකට විරුද්ධව හෝ තීරණ ගැනීමට ශක්තියක් ඇති පාර රාජ්‍යයේ ක්‍රියාකාරිත්වය කෙතරම් දුරට බලවත් වන්නේදැයි අපට පෙන්වනු ලැබේ.

මේ තත්වය තවදුරටත් අවුල් කිරීමට, දේශපාලනික වශයෙන් යම් යම් බලවේග පසු පස යන ඇතැම් මාධ්‍ය ආයතනද ක්‍රියාකාරී වන බව, සඳහන් කරනුයේ බලවත් කණගාටුවෙනි. මේ අය තමන්ට ලැබුණ විශේෂ වරප්‍රසාද නිසා මේ දේශපාලන නායක කාරකාදීන් ආරක්ෂා කිරීම සඳහා සිය පුවත් පත් හා මාධ්‍ය ජාල යොදවමින් දැන් සිදුවෙමින් පවතින විමර්ශන කඩාකප්පල් කිරීමට මාන බලන බව පෙනේ. මෙම ලාමක ප්‍රයත්නය අපි ප්‍රතික්ෂේප කරන බව සඳහන් කරසිටිමු.

**මන්දගාමීත්වය**

අතිගරු ජනාධිපතිතුමන් ඉතා උනන්දුවෙන් මේ කටයුත්තට අත ගසා ඇතත්, එය මෙහෙයවීමට උසස් නිලධාරීන් කණ්ඩායමකට පවරා ඇතත්, පවතින නීති පද්ධතිය හා එය ක්‍රියාවට නැංවීම බාර ඇතැම් නිලධාරීන්ගේ මන්දගාමී පැවැත්ම ඉදිරියේ, ඒ කටයුතු විවිධ බාධක මධ්‍යයේ සිදුවන තත්ත්වයකට පත්වී ඇත.

ජනතාව විසින් මේ පවතින රජයට අවශ්‍ය තුනෙන් දෙකක බලය ලබාදුන්නේ, අවශ්‍ය ලෙස ව්‍යවස්ථාමය හා නෛතික වෙනස්කම් කරමින් ශ්‍රී ලංකා දේශය ලෙයින් තෙත් කළ ඇතැම් දේශපාලනික හා ධාමරික බලවේග එළිදරව් කරමින්, මිනිස් ඝාතන, අතුරුදහන් කිරීම්, සුදු වෑන්, වදකාගාර, පාතාල ක්‍රියාකාරකම් පෞද්ගලික හමුදා ආදිය තුළින් අප ඉතිහාසයට කළු පැල්ලමක් එක් කළ අය හඳුනාගෙන ඒ අය නීතිය හමුවට ගෙන එන්නට ඉක්මනින් ක්‍රියා කරනු ඇතැයි සිතමිනි.

පාස්කු ප්‍රහාරයද ඒ දීර්ඝ කඳුළු කතාවේ තවත් එක පරිච්ඡේදයකි. දැනට පවතින නීති රීති, යුක්තිය ඉටුකර රට පිරිසිදු කිරීම සඳහා නොසෑහේ නම්, කළ යුත්තේ, ඒ නීතිරීති වෙනස් කිරීමට ධෛර්යවන්ත වීමයි. ඒ සඳහා මේ රටේ පොදු ජනතාව, ඉතා උනන්දුවෙන්, පවතින රජයට සහාය දැක්වූ බව පැහැදිලිය. ඒ අනුව අපි අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ සිදුවූ සියලු ප්‍රජාතන්ත්‍ර විරෝධී හා දේශපාලනිකව ත්‍රස්තවාදයට උඩ ගෙඩිදුන් ක්‍රියාදාමයන්ගෙන් අප සමාජය පිරිසුදු කිරීමට ක්‍රියාකාරී වන ලෙසයි.

## ඉල්ලීම්

අතිගරු ජනාධිපතිතුමනි, මේ ප්‍රහාරයේ අභිංසකයන්ගේ ලේ හැලීම, ඔබතුමන් 2024 ඔක්තෝබර් හයවෙනි දින මීගමුව කටුවාපිටියේදී පොරොන්දු වූ ලෙසම **"කාලයේ වැලිතලාවට යට වන්නට ඉඩ නොදී"** මෙහි සත්‍ය පසුබිම සොයා, එයට සම්බන්ධ සියලු පුද්ගලයින් නීතිය හමුවට ගෙන එනු ඇතැයි අපගේ ඒකායන බලාපොරොත්තුවයි. පැතුමයි. මේ සඳහා මා ඔබතුමන් වෙත යොමු කරන පහත සඳහන් ඉල්ලීම් ගැන ඔබතුමන් අවධානය යොමු කරනු ඇතැයි සිතමි.

1. දැනට පාර්ලිමේන්තු පුස්තකාලයට පමණක් ලබා දී ඇති පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනක් ද සිල්වා විනිසුරුතුමන්ගේ සභාපතිත්වයෙන් යුක්තවූ ජනාධිපති කොමිෂන් සභාව ඉදිරිපත් කළ වාර්තාව පාර්ලිමේන්තුවට හැකි ඉක්මනින් ඉදිරිපත් කර ජනගත කිරීම,

2. පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ සිදුවන වැඩිදුර විමර්ශන නිරීක්ෂණය කිරීමට සහ නඩු පැවරීමට පූර්ණ බලතල සහිත ස්වාධීන අභිචෝදක කාර්යාලයක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.

3. මෙම ප්‍රහාරය පිටුපස ක්‍රියාත්මක වූ සියලුම බලවේග කවරේදැයි සොයා බලා එහි සත්‍යය රටට හෙළිදරව් කර, ඒ සඳහා ක්‍රියාත්මක වූ චූදිතයන් සියලු දෙන තරාතිරම නොබලා නීතිය ඉදිරියට ගෙන ඒමට කටයුතු කිරීම,

4. 2019 සැප්තැම්බර් මස 21 වනදා පත්කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තාව නිර්දේශ කළ සියලු යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම හා,

5. හමුදා බුද්ධි අංශය හා සහරාන් හෂීම් නැමති ත්‍රස්තවාදී නායකයා අතර තිබූ සම්බන්ධතා හා ඒ පිළිබඳව එංගලන්තයේ **"චැනල් 4"** නාලිකාව තුළින් ඉදිරිපත් කළ වැඩසටහන පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් දියත් කර ඒ තුළ ප්‍රධාන පෙළේ සාක්ෂියක් මෙහෙයවූ අසාද් මවුලානා නැමැති අය කී දෙය ගැඹුරු විමර්ශනයකට ලක්කිරීම (මේ පිළිබඳව පසුගිය රජය පත්කළ ඉමාම් කමිටුව ඉදිරිපත් කළ වාර්තාව අප කිසිසේත් පිලිනොගන්නේ එම රූපවාහිනී වැඩසටහනේ ප්‍රධාන චරිතයක්වූ මෙම ආසාද් මවුලානා නමැති අයගෙන් කිසිදු ප්‍රශ්න කිරීමක් නොකර ඒ පිළිබඳව නිගමනවලට පැමිණීම නිසාවෙන් එය ප්‍රෝඩාකාරී දේශපාලන අවශ්‍යතාවයක් පිරිමසා ගැනීමට කරනලද ඇස් බැන්දුමක් පමණක් වූ නිසාය).

6. මෙම ප්‍රහාරය ක්‍රියාත්මකවීමට තුඩුදුන් සියලුම රහස් කුමන්ත්‍රණ පිටුපස තිබූ අවනීතියේ සංස්කෘතිය හා එයට උඩගෙඩි දෙන පාර රාජ්‍යය මෙ රටින් ඉවත් කිරීමට අවශ්‍ය නීති රීති සම්පාදනය කර රට තුළ යුක්ති ගරුකභාවය, සංහිඳියාව හා විනය ආරක්ෂා කරමින් ජනතාවගේ මානව හිමිකම් සුරැකීමට හා ශක්තිමත් කිරීමට කටයුතු කිරීම.

7. රට තුළ දේශපාලන බලය ඇති අය පුරවැසියාගේ සේවකයෝ මිස ඔවුන්ගේ පාලකයෝ නොවන *විවිධ ජාතීන් අත් කළ*, *නොකළ* සියලුම පුරවැසියන් රැකබලා ගනිමින් සමාජය තුළ දැහැමි බව හා සාමය ඇති කරලීමටද, කිසිදා මෙවන් ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් නැවත නිර්මාණය නොවන අයුරේ නව සංස්කෘතියක් වෙත අප රට මෙහෙයවීම.

**අන්තවාදය**

හිත මිතුරනි, මිනිස් ජීවිත 276ක් එක මොහොතකින් නැතිකර දමමින් රට තුළ ජාතිවාදයේ හා ආගම්වාදයේ ගිනි දළු දල්වා රටට මහා විනාශයක් ගෙන එමින්, රටේ කීර්තිය විනාශ කිරීමට දියත් කරන ලද මේ ම්ලේච්ඡ ප්‍රහාරය පිටුපස, ඇතැම් පසුගාමී බලවේග ක්‍රියාත්මක වූ බව ඔප්පු වූයේ එම ප්‍රහාරයට සති දෙකකට පසු මීගමුව ප්‍රදේශයේදීද, ඉන් සති තුනකට පසු හලාවත නාත්තන්ඩිය, දංකොටුව, මිනුවන්ගොඩ යන ප්‍රදේශවලදීද සිදු කරන ලද ජාතිවාදී ආගම්වාදී පහරදීම්ය.

ඒ පිළිබඳවත් ගැඹුරින් සොයා බැලිය යුතුවේ. මේ සියලුම ප්‍රහාරද එයට පෙර දිගන, දර්ගා නගරය යන ප්‍රදේශවල සිදුවූ ප්‍රහාරද මේ කතාවේ පෙරවදන වේ.

මේ රට තුළ ජාතිවාදය හා ආගම්වාදය පතුරවා, ලේ හලමින්, ලේ පිපාසයෙන් පෙළෙන ඇතැම් අන්තවාදී දේශපාලන බලවේග ගෙනගිය සැලසුම් හඳුනාගෙන, එවැනි සංවිධාන අප රට තුළින් ඉවත් කිරීමට

කටයුතු කිරීමද නීතිය හා සාමය රකින සියලු පුරවැසියන්ගේ ද අපගේ ද යුතුකමයි. මිනිමරු සංස්කෘතිය අප රටේ සියලුම ආගම් ප්‍රකාශකර සිටින සත්‍යතාවයන්ට විරුද්ධය. එබැවින් සියල්ලට වඩා රට පිරිසිදු කළ යුතු වන්නේ මේ මිනිමරු සංස්කෘතියෙනි.

එබැවින් ඒ සඳහා ක්‍රියාත්මක වෙමින් පාස්කු ප්‍රහාරය හා එවැනි අයුරේ ඝාතන, අතුරුදහන් කිරීම්, කලකෝලාහල ඇති කිරීම්, ආදියෙන් අප රට සදහට. මුදවා ගන්නට අපි සැම පෙළ ගැසෙමු.

ශ්‍රී ලංකා දේශය නිදහස් නිවහල් හා සාමයෙන් පිරුණු අපගේ මාතෘ භූමිය වේවායි  පතමු. ඒ වෙනුවෙන් දිවි හිමියෙන් කැපවෙමු.
ස්තූතියි !

✠ මැල්කම් කාදිනල් රංජිත්
කොළඹ අගරදගුරුතුමා

2025 අප්‍රේල් 21 වැනිද